# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,497 - 2026 ජූලි මස 10 සිකුරාදා - 2026.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1046 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1057 |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | 1062 |
| පළාත් පාලන නිවේදන ... ... | 1062 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1068 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1071 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 31 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 17 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|
| 1. | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු | III ශ්‍රේණිය තනතුරු- 01 | PL-3-2025<br><br>රු. 42,780- 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 66,540 | **අධ්‍යාපන සුදුසුකම් :**<br>අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම. (මින් විෂයයන් 05) ක් එක්වර සමත්වී තිබීම.<br><br>**වෘත්තීය සුදුසුකම් :**<br>1. බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ “ඒ” පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව “ඩී” පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.<br>2. අවම උස අඩි 5 විය යුතුය.<br>3. බර යන්ත්‍ර/ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳ තෘතීක හා NVQ 04 මට්ටමට අදාළ සහතිකපතක් තිබිය යුතුය.<br>4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.<br><br>**පළපුරුද්ද :**<br>බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්ද<br><br>**වයස :**<br>අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. | 1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.<br><br>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහි දී සලකා බැලේ.<br><br>2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - |

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය (බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳ ශිල්පීය හැකියාව පරීක්ෂා කෙරේ.) | 15 | |
| පෞරුෂත්වය (සම්මුඛ පරීක්ෂණයට මුහුණදෙන ආකාරය පරීක්ෂා කෙරේ.) | 5 | |

<table>
<tr><th></th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th><th>වැටුප් පරිමාණය</th><th>සුදුසුකම්</th><th>බඳවා ගැනීමේ ක්‍රමය</th></tr>
<tr>
<td>2</td>
<td>ආදායම් පරීක්ෂක</td>
<td>III ශ්‍රේණිය තනතුරු-02</td>
<td>MN-01-2025<br><br>රු.45,230-<br>10 x 540 -<br>11 x 630 -<br>10 x 890-<br>10x1,190-<br>රු. 78,360</td>
<td>අධ්‍යාපන සුදුසුකම් :<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;<br><br>වයස :<br><br>අවු. 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය.</td>
<td>1. ලිඛිත විභාගය :<br><br>ලිඛිත පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.<br><br>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>කාලය හා ලකුණු</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>කාලය: පැය 01<br><br>මුළු ලකුණු: 100<br><br>සමත් ලකුණු: 40%</td><td>තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම</td></tr>
<tr><td>සාමාන්‍ය දැනීම</td><td>කාලය : පැය 01<br><br>මුළු ලකුණු: 100<br><br>සමත් ලකුණු: 40%</td><td>ආර්ථික, සාමාජීය, අධ්‍යාපන විද්‍යාත්මක සංස්කෘතික , දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ.</td></tr>
</table>
<br>2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.</td>
</tr>
</table>

| | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|
| 3 | විදුලි කම්බිකරු | III ශ්‍රේණිය තනතුරු-01 | PL-3-2025<br><br>රු. 42,780- 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 66,540 | **අධ්‍යාපන සුදුසුකම් :**<br><br>1. ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයන් (05) ක් එක්වර සමත්වී තිබිය යුතුය.<br><br>2. විදුලි කම්බිකරු තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)<br><br>**වෘත්තීය සුදුසුකම් :**<br><br>*අ.* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*ආ.* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*ඇ.* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*ඈ.* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>*හෝ* | **1. ලිඛිත පරීක්ෂණය**<br><br>තනතුරට අදාළව පැවරී ඇති රාජකාරී පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා වන බහුවරණ ප්‍රශ්න 30 ක් හා මාර්ග නීති 10 කින් යුතු ප්‍රශ්න පත්‍රයකි.<br><br>• එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතුය.<br><br>**2. ප්‍රායෝගික පරීක්ෂණය**<br><br>මෙහිදී වෘත්තියට අදාළව රාජකාරී ඉටු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ කාර්මික හැකියාව අගයනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා එක් අයෙකු වෙනුවෙන් උපරිම කාලය පැය 1/2 කි. |

<table>
<tr><th></th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th><th>වැටුප් පරිමාණය</th><th>සුදුසුකම්</th><th>බඳවා ගැනීමේ ක්‍රමය</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td>ඉ. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>ඊ. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව, එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණකර සහතිකය ලබා තිබීම.<br><br>වයස :<br><br>අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.</td><td></td></tr>
<tr><td>4</td><td>ආදාහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු</td><td>01</td><td>PL-2-2025<br><br>රු. 41,800 - 10 x 490- 10 x 540- 1 0x 590- 12 x 630- රු. 65,560</td><td>අධ්‍යාපන සුදුසුකම් :<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එකවර සමත් ව තිබිය යුතුය.<br><br>වෘත්තීය සුදුසුකම්:<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබාගෙන තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>වයස :<br><br>අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.</td><td>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
<table>
<tr><th>ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්</td><td>20</td><td rowspan="3">50%</td></tr>
<tr><td>සාමාන්‍ය දැනීම :<br>ආර්ථික, සාමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ.</td><td>75</td></tr>
<tr><td>පෞරුෂත්වය</td><td>05</td></tr>
</table></td></tr>
</table>

<table>
<tr><th></th><th>තනතුරු නාමය</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th><th>වැටුප් පරිමාණය</th><th>සුදුසුකම්</th><th>බඳවා ගැනීමේ ක්‍රමය</th></tr>
<tr>
<td>5.</td>
<td>සෞඛ්‍ය පරිපාලක</td>
<td>01</td>
<td>MN-01-2025<br><br>රු.45,230 - 10 x 540 - 11 x 630 - 10 x 890- 10 x1190- රු. 78,360</td>
<td>අධ්‍යාපන සුදුසුකම් :<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>වයස :<br><br>අවු. 18 - 30 ත් අතර විය යුතුය.</td>
<td>1. ලිඛිත විභාගය :<br><br>ලිඛිත පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>කාලය හා ලකුණු</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>කාලය: පැය 01<br><br>මුළු ලකුණු : 100<br><br>සමත් ලකුණු : 40%</td><td>තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම</td></tr>
<tr><td>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>කාලය : පැය 01<br><br>මුළු ලකුණු 100<br><br>සමත් ලකුණු 40%</td><td>ආර්ථික, සාමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික , දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ.</td></tr>
</table>
2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - සුදුසුකම්</td>
</tr>
</table>

(02) ඉහත එක් එක් තනතුරට අදාළව සඳහන් කර ඇති සුදුසුකම්වලට අමතරව සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කොන්දේසිවලට ද යටත් විය යුතුය :-

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. සෑම අයදුම්කරුවකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
5. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(03) අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

- මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් පිළියෙළ කර ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2026.08.10 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, බුලත්සිංහල ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය.

- අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට ඒවායෙහි මුල පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

  1. උප්පැන්න සහතිකය;
  2. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
  3. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද තහවුරු කිරීම සඳහා සහතික;
  4. ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපත.

(04) අදාළ බඳවා ගැනීම් පටිපාටිවල විධිවිධාන අනුව ලිඛිත පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කිරීමෙන් ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

(05) අයදුම්පත් කැඳවීම, විභාගය පැවැත්වීම, බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හා මෙම බඳවා ගැනීම් සම්බන්ධව විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධව අවසාන තීරණය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ඇත.

(06) මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨයන්හි ඇති වන පරස්පරතාවයන්හි දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(07) යම් අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට පත්වීමක් ලබා දීම සම්බන්ධව තවදුරටත් සලකා බලනු නොලබන අතර ඔහුට/ඇයට දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුව ද පුළුවන.

(08) සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-

(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.

(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතුය.)

(iii) වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(iv) මෙයට අමතරව කලින් කලට සංශෝධනය විය හැකි බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් කොන්දේසි, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය, පළාත් මුල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් කලින් කල පනවනු ලබන නියමයන් ට යටත් විය යුතුය.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - බුලත්සිංහල.

2026 ජූලි මස 10 දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ........................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ...................................................................................................

02. සම්පූර්ණ නම (සිංහලෙන්) : ...................................................................................................

03. මුලකුරු වලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ...................................................................................................

04. ස්ථිර ලිපිනය : ...................................................................................................

05. තාවකාලික ලිපිනය : ...................................................................................................

06. උපන්දිනය : ...............................................

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ....................... මාස: ..................... දින :...................

08. ජාතික හැඳුනුම්පත් අංකය : ................................................................................

09. විවාහක/අවිවාහක බව : ....................................................................

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව : ....................................................................

(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය)

11. අධ්‍යාපන සුදුසුකම් : (ඡායා පිටපත් අමුණන්න.)

(a) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල :

...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................

(b) අ.පො.ස.(උසස් පෙළ) විභාග ප්‍රතිඵල :

...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................

12. පළපුරුද්ද :

...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................
...................................................................................................

(සහතිකපත් මගින් සනාථ කළ යුතුය.)

13. වෘත්තීය සුදුසුකම් :

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
(සහතිකපත් මගින් සනාථ කළ යුතුය.)

14. වෙනත් සුදුසුකම් :

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
(සහතිකපත් මගින් සනාථ කළ යුතුය.)

15. (i) ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? (ඔව්/නැත)

(ii) ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය කුමක්ද?

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

16. ඔබ පිළිබඳ තොරතුරු ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ විස්තර මෙහි සඳහන් කරන්න.

(1) නම ...............................................................

ලිපිනය :...............................................................

(2) නම :...............................................................

ලිපිනය :...............................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා උක්ත තනතුර සඳහා නුසුදුස්සෙකු වන බවත්, උක්ත තනතුර සඳහා තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි කරුණක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහකළ හැකි බවත් මා දනිමි.

.......................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................

07-186

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාවේ නාගරික ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා ව්‍යාපෘති සහයකවරයෙකු බඳවා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත නාගරික ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා ව්‍යාපෘති සහායකවරයෙකු බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි තනතුරු නාමය සඳහන් කර 2026.07.24 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

| | | |
|---|---|---|
| 1. | තනතුරු සංඛ්‍යාව | : තනතුරු 01 |
| 2. | වයස | : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. |
| 3. | මාසික වැටුප | : රු. 25,000 |
| 4. | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | : ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සවත්වීම (සාමාන්‍ය පොදු ඉංග්‍රීසි හැර);<br>*සහ*<br>පරිගණක භාවිතය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. (පරිගණක දැනුම ලබා ගැනීමට අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය.)<br>*සහ*<br>සිංහල, ඉංග්‍රීසි භාෂා දැනුම තිබිය යුතුය.<br>*සහ*<br>ක්‍රීඩා කටයුතු හා සම්බන්ධ ආයතනයක සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |
| 5. | තෝරා ගැනීමේ ක්‍රමය | : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගනු ලැබේ.<br><br>සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන ව්‍යාපෘති සහායක පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.<br><br>1. ගෘහස්ත ක්‍රීඩාගාරය රජයේ නිවාඩු දිනයන්හි හැර අනෙකුත් සියලු දිනයන්හි පෙ. ව. 6.00 සිට ප.ව. 10.00 දක්වා ක්‍රියාත්මක වන අතර සේවා මුර ක්‍රමයකට සේවකයින් යෙදවීම සිදු කරනු ලබයි. උදෑසන සේවා මුරය පෙ.ව. 6.00 සිට ප. ව. 2.00 දක්වාත් සවස සේවා මුරය ප. ව. 2.00 සිට ප. ව. 10.00 දක්වාත් ක්‍රියාත්මක වේ. සේවා අවශ්‍යතාවය මත මෙම සේවා මුර 2න් කවර සේවා මුරයක හෝ සේවයේ යෙදීමට හැකිවිය යුතුය.<br><br>2. දිනකට අවම පැය 08 ක කාලයක් සේවාව සැපයිය යුතුය. මාසික දීමනාව ලබා ගැනීම සඳහා අවම වශයෙන් දින 21 ක් වැඩ කළ යුතුය.<br><br>3. තමා සේවයේ යෙදෙන සේවා මුරය තුළ පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය. |

4. සේවයේ අවශ්‍යතාවය මත ඇතැම් අවස්ථාවන්හි සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි සේවය සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හිදී උක්ත දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කළ යුතු වේ.

5. සේවා සැපයීමට අදාළ අවු. 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

6. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු මහනුවර නගර සීමාව තුළ පදිංචිකරුවකු විය යුතුය.
- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

*සටහන* :- මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරී අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ජූලි මස 10 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මහනුවර මහා නගර සභාවේ නාගරික ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා ව්‍යාපෘති සහායකවරයෙකු බඳවා ගැනීම***

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය : ..............................................................................

02. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..............................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : ....................මාසය: .................... දිනය: ....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.07.17 දිනට) වයස: අවුරුදු : ............... මාස. :........... දින :.............

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................................................................

07. විවාහක / අවිවාහක භාවය : ..............................................................................

08. ස්ථිර ලිපිනය : ..............................................................................

09. දුරකථන අංකය : ..............................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග? : ..........................................................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව :...........................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

12. උපාධි හා වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ තොරතුරු .
..........................................................................................................................................
..........................................................................................................................................

13. වෘත්තීය සුදුසුකම් / සාමාජිකත්වය හා සේවා පළපුරුද්ද :
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

14. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................

07-180

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාතේ පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන -ඛණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුර III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරට බඳවා ගැනීමට අදාළ වන විවෘත තරග විභාගය සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.08.14 දින වේ.

(බඳවා ගැනීමේ පටිපාටිය 2015.01.02 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීම සහ උසස් කිරීමේ පටිපාටිය)

පුරප්පාඩු ගණන - 01

වැටුප් පරිමාණය - MN-1-2025 රා.ප.ච.10/2025
රු. 45,230.00-10×540-11×630-10×890-10×1190- රු. 78,360.00

**1. බඳවා ගැනීමේ සුදුසුකම් :**

*(අ)*. අධ්‍යාපන සුදුසුකම් (විවෘත අයදුම්කරුවන් සඳහා)

- සිංහල/ දෙමළ /ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

- අධ්‍යයන පොදු සහතික පත්‍ර(උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*(ආ)* වෙනත් සුදුසුකම්

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

*(ඇ)* ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

**2. බඳවා ගැනීම සඳහා වන කොන්දේසි :**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි තැනැත්තකු විය යුතුය.

iii. යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iv. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළ පරීක්ෂණවල දී කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුද යන්න පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් තීරණය කරනු ලබන ආකාරයකට විය යුතුය. තමා වෙත පිරිනමන තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාරගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්ට බලය ඇත.

v. කිසියම් අයදුම්කරුවෙකු බඳවා ගැනීමේ පරීක්ෂණයකට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුසුසකු ලෙස සලකනු නොලැබේ.

**3. ලිඛිත පරීක්ෂණයේ සංයුතිය :**

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනුම | 100 | 40% |

**විෂය නිර්දේශය :**

අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය : තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව

**සාමාන්‍ය දැනීම** : මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජීය, අධ්‍යාපනික, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මනිනු ලබයි.

**සටහන :** ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙළ අනුව වැඩි ලකුණු ලබා ගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

**සටහන:** ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර මෙකී පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ.

**සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ.මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ..

**4. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

iii. බඳවාගනු ලබන තැනැත්තන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

iv. මෙයට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, බස්නාහිර පළාත් කාර්ය පටිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ සේවා කොමිෂන් සභාව විසින් හා බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ පාලින්දනුවර ප්‍රාදේශීය සභා ලේකම් විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

**5. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.5′x12′ A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර (අ) සිට (ඒ) දක්වා වන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතුය;

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික,

(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,

(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික,

(ඉ) තනතුරට අදාළ වෙනත් සහතික,

(ඊ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(උ) ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය සනාථ කිරීමේ දී අවිනිශ්චිතව ලබා දී ඇති සනාථ කිරීම සළකා බලනු නොලැබේ. (*උදා* :- වසර 05ක සිට පදිංචිව සිටින බව පවසයි.),

(එ) තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබාගත් පොලිස් වාර්තාවක් (මෙය අයදුම්පත් භාර ගන්නා දිනට ඉහතින් වූ මාස හයකට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතුය),

(ඒ) චරිත සහතිකයක්.

iii. ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරණ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාතේ පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන -බණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුර III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026" ලෙස සඳහන් කර 2026.08.14 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, බදුරලිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය

iv. තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. අදාළ බඳවා ගැනීම් පටිපාටිවලට අනුව මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් තෝරා ඔවුන් බඳවා ගැනීමේ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පතේ සාවද්‍ය තොරතුරු සඳහන් කර පරීක්ෂණ සඳහා සහභාගි වූ බවට අනාවරණය වුවහොත් එවැන්නන් අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරනු ලබන අතර එසේ වුවහොත් මින් ඉදිරියට මෙම සභාව සඳහා සිදුකරන කිසිදු සේවක බඳවා ගැනීමක් සඳහා අයදුම් කිරීමේ අවස්ථාව එවැනි අයදුම්කරුවන්ට අහිමි වනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීම, බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

ජී. සමන්ති පෙරේරා,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

**ආදායම් පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත්‍රය**

**1. ජීව දත්ත තොරතුරු :**

1.1 අයදුම්කරුගේ මුල අකුරු අගට යොදා මුල අකුරු සමග නම (උදාහරණ : සිල්වා ඒ.බී.සී.) :

:...........................................................................................................

1.2 සම්පූර්ණ නම :...........................................................................................................

1.3 ස්ථිර ලිපිනය :...........................................................................................................

...........................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................

1.6 දුරකථන අංකය : ..........................................................

1.7 උපන්දිනය : වර්ෂය : | | | | | මාසය | | | දිනය | | |

1.8 2026.08.14 දිනට වයස: අවුරුදු.............. මාස............ දින.................

2. **අධ්‍යාපන සුදුසුකම් :**

2.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය

විභාග අංකය .................. වර්ෂය..........................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| I | | Vi | |
| ii | | Vii | |
| iii | | Viii | |
| iv | | ix | |
| v | | x | |

2.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය

විභාග අංකය .............................. වර්ෂය .....................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| I | | iv | |
| ii | | v | |
| iii | | | |

3. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් ද? ඔව් ☐ නැත ☐

ඔව් නම්,

3.1 ආයතනයේ නම :-..........................................................................................

3.2 ඔබ දැනට දරන තනතුර :-.......................................................................

3.3 ස්ථිර පත්වීම් දිනය :-..................................................................

3.4 සේවය ස්ථිර කරන ලද දිනය:-...............................................................

4. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :.....................................................................

4.1 ඔබ විසින් ඉල්ලුම් කරන ලද තනතුරට අදාළව වෘත්තීය පළපුරුද්දක් ලබා තිබේද?..............................

4.2 එසේ නම් පුහුණුව ලැබූ ආයතනයේ නම:.........................................................................................

4.3 පුහුණුව ලැබූ කාලය( මාස 03/ මාස 06/ අවුරුද්දක්):..............................................................................

5. තනතුරට අදාළ වෙනත් සුදුසුකම්:

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

6. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

ඔව් ☐ නැත ☐

ඔව් නම් විස්තර සඳහන් කරන්න..................................................................................................................

...................................................................................................................................................................

**7. අයදුම්කරුගේ සහතිකය:**

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍යය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

............................ ......................................

දිනය අයදුම්කරුගේ අත්සන.

**8. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .........................................................................................මයා/ මිය /මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ඔහුගේ/ ඇයගේ අත්සන ................................................ දින තැබූ බවද සහතික කරමි.

....................................... ..........................................................................

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :................................................................

තනතුර :..................................................................

ලිපිනය :............................................

නිල මුද්‍රාව යොදන්න :.....................................................

දිනය :.............................................................................

**සැළකිය යුතුයි:**

නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැරදි තොරතුරු ලබාදී පරීක්ෂණ සඳහා සහභාගී වන අයදුම්කරුවන් මින් ඉදිරියට සිදුකෙරෙන කිසිදු බඳවා ගැනීමකට සලකා නොලැබීම සඳහා අසාධු ලේඛනගත කරනු ලැබේ.

07-189

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**කොළඹ මහා නගර සභාව**

කොළඹ මහා නගර සභාවට අයත් පැරණි පුවත්පත් අපහරණයකර විකිණීමට මිල ගණන් කැඳවීම

කොළඹ මහා නගර සභාවට අයත් සියළු කාර්යාලයන්හි පැරණි පුවත්පත් කිලෝ 1500 කට ආසන්න ප්‍රමාණයක් අපහරණය කර විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලබන අතර ඒ සඳහා ඔබ විසින් සකස් කරන ලද ආකෘති පත්‍රයකට අනුව පත්තර කිලෝ එකක් සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් 2026/07/24 දින පෙ. ව. 10.00 ට පෙර කොළඹ 07, පුරහල පරිශ්‍රයේ නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (පාලන) අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු අතර, එදින පෙ. ව. 10.00ට එම ස්ථානයේ දී මිල ගණන් විවෘත කරනු ලැබේ. මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාව සඳහා බලයලත් නියෝජිතයෙකු හට සහභාගී වීමට අවස්ථාව ඇත.

ඒ. ඩී. එස්. රෝහණ,<br>
නාගරික කොමසාරිස්,<br>
කොළඹ මහා නගර සභාව.

07-201

---

# පළාත් පාලන නිවේදන

**මීගමුව මහා නගර සභාව**

ගෝ ඝාතක ආඥාපනතේ (272) වන අධිකාරය යටතේ විරෝධතා කැඳවීම

මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, නුවනි සුදුසිංහ වන මම, මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2026 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයෙහි ගව/ඌරු මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයවළුන් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දා සිට, දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝ ඝාතක ආඥා පනතේ (272) වන අධිකාරය 7(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,<br>
නාගරික කොමසාරිස්,<br>
මහා නගර සභාව,<br>
මීගමුව.

2026 ජුනි මස 30 දින,<br>
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | - | කේ. එල්. ඩී. සසංක පෙරේරා |
| මස් වෙළඳාම පවත්වාගෙන යාමට යෝජිත ස්ථානය | - | අංක 10, 2 අදියර, කඩොල්කැලේ, මීගමුව |
| වෙළඳාමේ ස්වභාවය | - | ගවමස් හා ඌරු මස් වෙළඳාම |

07-191

**කෑගල්ල මහා නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2027 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. එකී සමාජ ශාලාව පවත්වාගෙන යාම සඳහා යම් පාර්ශවයක්, යම් ආයතනයක් විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරෝධතාවයට හේතු ලියවිල්ලක් මගින් දක්වමින්, පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

නගරාධිපති,
කෑගල්ල මහා නගර සභාව..

2026 ජුනි මස 19 දින,
කෑගල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/ පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල්,<br>අංක 167/28,<br>ඔලගම, කෑගල්ල | සභාපති | බ්ලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක 152,<br>කළුගල්ල, කෑගල්ල |

07-122

---

**බණ්ඩාරවෙල මහා නගර සභාව**

බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ නාසරත් කොන්වන්ට් අසල සිට සේනානායක පාර දක්වා මාර්ගය
**"නාසරෙත්"** මාර්ගය ලෙස නම් කිරීම

2026 වර්ෂයේ අගෝස්තු 01 දින සිට

වර්ෂ 2026 මාර්තු මස 12 වන දින බණ්ඩාරවෙල මහා නගර සභාවේ මාසික මහා සභා තීරණයක් මත, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) අංක 71(1) වන වගන්තිය ප්‍රකාරව ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර නීතිඥ ජේ. එම්. කපිල ජයසේකර මහතාගේ අනුමැතිය මත, මෙම මහා නගර සභා බල ප්‍රදේශයේ නාසරත් කොන්වන්ට් අසල සිට සේනානායක පාර දක්වා මාර්ගය "නාසරෙත්" මාර්ගය නමින් 2026 අගෝස්තු මස 01 දින සිට නම් කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. එම්. එස්. ඩී. විශ්ව වික්‍රම,
නගරාධිපති.

2026 ජුනි මස 30 දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

07-168

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ කාර්ය පටිපාටිය අනුගමනය කිරීම සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වන වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,471 හා 2026.01.09 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුනා වූ ඊට අදාළ නිවේදනය යටතේ උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු සභාව විසින් පවත්වා ගෙන යනු ලබන මාංමාවත්/පාරවල් ලෙස මෙයින් නිවේදනය කරමි.

නලීන් එරන්ද පිටියේකුඹුර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.


2026 ජුනි මස 18 වැනි දින,
පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | දිග | පළල | පිඹුරු පත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ලැවනියන්ගේ කුඹුර පාර | කුඩා ඔය | රතනසාර මාවත (68/බී/1, ඌරාපොළ , පිළිමතලාව ලිපිනයෙහි කේ. වී. දූෂාන්ත ලයනල් මහතාගේ නිවස අසලින්) | බෝධිය අසලින් | 1. ඩී. කේ. එස්. යටවර මයා<br>2. සුසන්ත ලයනල් මයා<br>3. එම්. ජී. ගුණරත්න මයා<br>4. ඩබ්. ජී. සේනාධීර මයා | 1. ඩී. එම්. අයි. සමරකෝන් මයා<br>2. ඩී. එම්. සාන්ත දිසානායක මයා | මීටර් 300 | මීටර් 3.35 | 6085 |

K.B. Lansakaranayake
Licensed Surveyor
Pilimathalawa.

COPY

**PLAN NO: 6085**




Scale 1:1000

# P L A N

Of
A divided Portion of land called
**Lavanianga kumbura now High Land** (Lots1, 2, 3 & 4) and
**Palle Lawaniyanga** (Lots 5 & 6)
(Covered by Lot 1 in Plan No 1591 dated 11th January 2005 by
W.M.M. Asoka Wijayakoon Licensed Surveyor.
Lot 3 in Plan No 1772 dated 16th February 2007 by D.R. Abeykoon Licensed Surveyor.
Lot 1A in my Plan No 1574 dated & 12th June 2007 and 18th December 1996 &
Lot 5 in my Plan No 4364 dated 19th December 2003.).
Situated at **Urapola.**
in Medapalatha Korale of Yatinuwara.

## Kandy District – Central Province

Containing in Extent:-

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hectares | A | R | P | |
| 1 | 0.13611 | 0 | 1 | 13.80 | Portion of Lot 1 in Plan No 1591 by W.M.M. Asoka Wijayakoon L/S |
| 2 | 0.03036 | 0 | 0 | 12.00 | Portion of Lot 1 in Plan No 1591 by W.M.M. Asoka Wijayakoon L/S |
| 3 | 0.00632 | 0 | 0 | 02.50 | Road (11Ft wide) Portion of Lot 1 in Plan No 1591 by W.M.M. Asoka Wijayakoon L/S |
| 4 | 0.00990 | 0 | 0 | 03.90 | Road (11Ft wide) Lot 3 in Plan No 1771 by D.R. Abeykoon L/S |
| 5 | 0.01315 | 0 | 0 | 05.20 | Road (11 Ft wide) Lot 1A in my Plan No 1574 and Portion of Lot 5 in my Plan No 4364 |
| 6 | 0.01173 | 0 | 0 | 04.64 | Portion of Lot 5 in my Plan No 4364 |
| Total | 0.20757 | 0 | 2 | 02.04 | |

Surveyed on: - 26-06-2007
Sgd:- K.B. Lansakaranayake
Licensed Surveyor

TRUE COPY
2013-01-11

E. K. D. J. S. K. SIRIWARDENA
Registered Licensed Surveyor
No: 368 A, Colombo Road
Eriyagama - Peradeniya

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ කාර්ය පටිපාටිය අනුගමනය කිරීම සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වන වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,471 හා 2026.01.09 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන්නට යෙදුනා වූ ඊට අදාළ නිවේදනය යටතේ උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු, සභාව විසින් පවත්වා ගෙන යනු ලබන මාංමාවත්/පාරවල් ලෙස මෙයින් නිවේදනය කරමි.

නලින් එරන්ද පිටියේකුඹුර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.


2026 ජුනි මස 22 වැනි දින,
පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | රුක්ගහකොටුව මල්වත්ත අතුරු මාර්ගය | පහළ රත්මීවල | රුක්ගහකොටුව පාර රුක්අත්තන ගස අසලින් (අංක 50ඊ/ පහළ රත්මීවල, මැණික්දිවෙල යන ලිපිනය සහිත නිවස අසලින්) | ඔලියංග පාරේ ඩබල් කැට දක්වා (අංක 55 ඊ/පහළ රක්මීවල, මැණික්දිවෙල යන ලිපිනය සහිත නිවස අසලින්) | 1. ආර්. විජේකෝන් මයා<br>2. පී. එම්. ජයසිංහ මයා<br>3. ආර්. පී. සමරසිංහ මයා<br>4. ආර්. පී. චිත්‍ර සේන මයා<br>5. ආර්. ජී. සී. රත්නායක මයා<br>6. ඒ. නිමල් ජයවීර මයා | 1. ආර්. පී. චිත්‍ර සේන මයා<br>2. සී. කේ. පී. එම්. වැවලගොඩ මයා<br>3. ආර්. විජේකෝන් මයා<br>4. ආර්. ජී. මාලනී මිය<br>5. ආර්. ආර්. සී. රත්නායක මයා<br>6. ඒ. සුනිල් රාජරත්න මයා | මීටර් 210 | මීටර් 2.43 | 11527 |

C.S.Liyanage
Registered Licensed Surveyor
court commissioner & Valuer
Reg. No. 19700573

PLAN NO: 11527




*Reference*

| | |
|---|---|
| St | : Steak |
| M | : Boundary Mark |
| EP | : Electricity Post |
| LF | : Live Fence |
| BW | : Boundary Wall |
| RW | : Retaining Wall |
| Road(PS) | : Road (Pradesheeya Sabha) |

Note:
The section that includes the Drain is also belongs to the proposed Road.

Scale 1 : 1000

# Plan

of Excisting Road & Proposed portion of "Rukgahakotuwa - Malwatta byroad"
Situated at Rathmeewala Village in Grama Niladharee Division of 197 - Pahala Rathmeewala
In Pradesheeya Sabha limits of Yatinuwara In Yatinuwara Kandupalatha
Divisional Secretary's Division of Yatinuwara

## Kandy District
## Central Province

| Lot No : | Extent | | | |
|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. |
| 1 | 0.0529 | 0 | 0 | 20.90 |
| Total | 0.0529 | 0 | 0 | 20.90 |

Date on 13.09.2025

C.S. LIYANAGE (M.G.I)
Registered Licensed Surveyor
Court Commissioner & Valuer
Reg. No: 19700573

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## කල්පිටිය ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 රීතියේ විධිවිධානවලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය කරන ලද කල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2025.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

ඒ. එස්. එම්. රික්කාස්.
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2025 ජූනි මස 24 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛන අංක I

**2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය**

| | *සටහන්* | *31.12.2025 රු. ශත* | *31.12.2024 රු. ශත* |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | |
| මෙහෙයුම් ආධාර | 1 | 59,933,315.47 | 52,360,718.70 |
| මෙහෙයුම් ආදායම් | 2 | 129,341,916.74 | 125,344,257.64 |
| **මුළු මෙහෙයුම් ආදායම්** | | **189,275,232.21** | **177,704,976.34** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුනරාවර්තන වියදම් | 3 | 199,050,171.26 | 114,657,125.86 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **199,050,171.26** | **114,657,125.86** |
| වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය ඌණතාවය | | **(9,774,939.05)** | **63,047,850.48** |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 30,623,512.35 | 133,589,049.61 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 57,777.005.14 | 127,074,674.29 |
| අතිරික්තය/ඌණතාවය | | (27,153,492.79) | 6,514,375.32 |
| **වර්ෂයේ අතිරික්තය /**ඌණතාවය | | **(36.928,431.84)** | **69,562,225.80** |

## උපලේඛන 2

## 2025.12. 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | *31.12.2025*<br>*රු. ශත* | *31.12.2024*<br>*රු. ශත* |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය | (9,774,939.05) | 63,047,850.48 |
| මුදල් නොවන අයිතමයන්ගේ වෙනස් වීම් සඳහා ගැලපීම් | - | - |
| ක්ෂය වීම | - | - |
| පූර්ව වර්ෂ සඳහා ගැලපීම් | 4,535,408.07 | 6,778,916.81 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය /ඌණතාවය | (5,239,530.98) | 69,826,767.29 |
| **කාරක ප්‍රාග්ධනයේ සංචලනයන්** | | |
| තොග/ණයගැති හා වෙනත් ලැබිය යුතු දේවල් වල වැඩි වීම්/අඩුවීම් | 123,408,109.60 | (182,256,724.47) |
| ණය හිමි හා වෙනත් ගෙවිය යුතු දේවල් වල වැඩි වීම්/අඩු වීම් | 34,442,630.85 | (134,753,101.82) |
| | **88,965,478.75** | **(47,503,622.65)** |
| මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | **83,725,947.77** | **22,323,144.64** |
| පාරිතෝෂික ගෙවීම් | **-** | **-** |
| මෙහෙයුම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **83,725,947.77** | **22,323,144.64** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ මිලට ගැනීම් | | |
| ප්‍රාග්ධන වියදම් | (57,777,005.14) | (127,074,674.29) |
| මුදල් ආයෝජනය | (13,278,923.53) | (36,740,587.84) |
| ප්‍රාග්ධන ආධාර ලැබීම් | 30,623,512.35 | 133,589,049.61 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (40,432,416.32) | (30,226,212.52) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| ණය ගැනීම්/ණය ගෙවීම් | **-** | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| වර්ෂය තුළ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 43,293,531.45 | (7,903,067.88) |
| 2025.01.01 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ | 55,217,572.90 | 63,120,640.78 |
| **2025.12.31 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ** | **98,511,104.35** | **55,217,572.90** |

| | *31.12.2025*<br>*රු. ශත* | *31.12.2024*<br>*රු. ශත* |
|---|---|---|
| සටහන | | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම - පොදු | 92,974,884.43 | 53,654,520.33 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම - කර්මාන්ත | - | - |
| මහජන බැංකුව - ජංගම ගිණුම - සේවක ණය | 5,523,459.92 | 1,554,102.57 |
| මුද්දර | 12,760.00 | 8,950.00 |
| | **98,511,104.35** | **55,217,572.90** |

**උපලේඛන 3**

**2025.12. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | *සටහන* | *31.12.2024*<br>*රු. ශත* | *31.12.2025*<br>*රු. ශත* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 6 | 866,383,268.70 | 872,704,958.34 |
| ජංගම වත්කම් | | | |
| තොග | 7 | 18,884,494.00 | 11,648,551.61 |
| ආදායම් ණය ගැතියෝ | 8 | 272,618,021.01 | 154,195,296.78 |
| සේවක ණය හා අත්තිකාරම් | 9 | 9,278,688.67 | 11,204,185.56 |
| පෙර ගෙවුම් | 10 | 286,620.15 | 611,680.28 |
| ආයෝජන | 11 | 36,946,803.87 | 50,225,727.40 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 12 | 55,217,572.90 | 98,511,104.35 |
| | | 393,232,200.60 | 326,396,545.98 |
| **මුළු වත්කම්** | | **1,259,615,469.30** | **1,199,101,504.32** |
| හිමිකම් හා වගකීම් | | | |
| සමුච්ත අරමුදල හා සංචිත | 13 | 1,057,204,064.33 | 1,031,132,730.20 |
| | | **1,057,204,064.33** | **1,031,132,730.20** |
| ජංගම නොවන වත්කම් | | | |
| දිගු කාලීන ණය | 14 | - | - |
| ජංගම වගකීම් | 15 | 202,411,404.97 | 167,968,774.12 |
| | | **202,411,404.97** | **167,968,774.12** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **1,259,615,469.30** | **1,199,101,504.32** |

ඒ. එස්. එම්. රික්කාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

07-115

# විවිධ දැන්වීම්

## කුරුවිට ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම - 2026

2011.09.02 දින අංක 1722 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV කොටසේ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026 වර්ෂයේ සිට අය කිරීමට කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් 2026 ජූනි 05 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06-59 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. විකසිත පුෂ්පසූරිය,
සභාපති,
කුරුවිට ප්‍රාදේශීය සභාව.

2026 ජූනි මස 25 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| *විස්තරය* | *වර්ෂයකට වර්ග අඩි 01 කට ගාස්තු (ඩිජිටල් ස්ථිර නාමපුවරු සඳහා) රු. ශත* |
|---|---|
| කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථාපනය කරන ඩිජිටල් ස්ථිර නාම පුවරු සඳහා ගාස්තු | 1,250.00 |

07-123

---

## කුරුණෑගල මහා නගර සභාව

### කුරුණෑගල මහ නගර සභාව තුළ 2026 වර්ෂය සඳහා ආදායම් උත්පාදනයන්

කුරුණෑගල මහා නගර සභාව විසින් 2026.06.11 දින පවත්වන ලද මහ සභා සම්මුති අංක GC/06/14/2026/06/11/MCK/HD/08 යටතේ 2026.06.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන යෝජනාව මගින් ආදාහනාගාරයේ ආදාහන ගාස්තු අය කිරීම සංශෝධනය කිරීමේ යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද ඇන්ටන් සහබන්දු,
නගරාධිපති,
කුරුණෑගල මහා නගර සභාව.

2026 ජූනි මස 23 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දීය.

**13.** ආදාහනාගාරයේ ආදාහන ගාස්තු අය කර ගැනීම

| *අනු. අංකය* | *කාරණය* | *ගාස්තුව (රු.)* |
|---|---|---|
| 13.1 | ගාස්තු අය කිරීම | |
| 13.1.1 | කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා ග්‍රාම නිලධාරී නිර්දේශය මත (සේවා ගාස්තුව රු. 1000 ක් සමග) | 15,000.00 |
| 13.1.2 | කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය නොමැති (පිටස්තර) ජනයා සඳහා (සේවා ගාස්තුව රු. 1000 ක් සමග) | 25,000.00 |
| 13.1.3 | නගර සභාවේ සේවකයන් සඳහා (නගර සභාවේ සේවකයින්ගේ මව, පියා සහ ස්වාමිපුරුෂයා/ භාර්යාව/දරුවන් සඳහා) | 10,000.00 |
| 13.2 | සේවා ගාස්තු ගෙවීම | |
| 13.2.1 | සුසානභූමි භාරකරු සඳහා මුළු සේවා ගාස්තුවෙන් - 30% | |
| 13.2.2 | ආදාහනාගාර ක්‍රියාකරු සඳහා මුළු සේවා ගාස්තුවෙන් - 30% | |
| 13.2.3 | කම්කරුවන් දෙදෙනෙකු සඳහා මුළු සේවා ගාස්තුවෙන් - 40% | |

07-121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.